## ඓතිහාසික පසුබිම



දැදිගම ඇත් පහණ/Dedigama Eth Pahana

කෑගලු දිස්ත්‍රික්කයට අයත් භූමි ප්‍රදේශය ඓතිහාසික යුගය දක්වා අතීතයට උරුම කම් කියන ප්‍රදේශයක් බව මෙහි ඇති පුරාවිද්‍යා සාක්ෂි මඟින් හෙලිදරව් වේ. අදින් වසර 28,000 පෙර ආදි මානව පොසිල හමුවූ බෙලි ලෙන ඇතුළු ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ ගල් ලෙන් බොහෝමයක් මෙම ප්‍රදේශයෙන් හමු වී ඇත.දොරවක ලෙන, අලු ලෙන, ලෙනගල, අස්මඩල, අම්බල කන්ද, හැලමඩ ආදී ප්‍රදේශවලින් ද ප්‍රාග් මානවයා පිළිබඳ සාධක රාශියක් ලැබී ඇත.මෙයින් පදවිගම්පොල ගල් පියස්ස ප්‍රාග් ඓතිහාසික යුගයේ නෂ්ටාවශේෂයක් බව සලකනු ලැබේ. අතීත ශ්‍රී ලංකාවේ රුහුණු, මායා, පිහිටි යන රටවලින් මායා රටට අයත් වන මෙම ප්‍රදේශය ශ්‍රී ලංකාවේ අසහාය නරපතියෙකු වන පළමු වන විජයබා රජතුමා සොලී අධිරාජ්‍යයෙන් ශ්‍රී ලංකාව ගලවා ගැනීමේ සටනට ද දායක වී ඇත. එතුමාගේ සුරක්ෂිත බලකොටුවක් වූ වාකිරිගල දුර්ගය මෙම ප්‍රදේශයේ පිහිටා ඇත. මහා පරාක්‍රමබාහු රජතුමා උපන් ස්ථානය ලෙස දැදිගම කොටවෙහෙර පිලිගන්නා අතර අතීත නරපතියන් බොහෝදෙනෙකුට සිය සටන් සඳහා ශ්‍රම හා ආර්ථික දායකත්වයක් ලබා දුන් ප්‍රදේශයක් ලෙස වර්තමාන කෑගලු දිසාව පිහිටි ප්‍රදේශය ඉතිහාසයට එක් වී ඇත.

ශ්‍රී ලංකාව බටහිර ජාතීන්ගේ බලපෑම් වලට නතුවූ සමයේ මායාදුන්නේ රජතුමා පිහිටුවාගත් සීතාවක රාජධානියේ විශාල ප්‍රදේශයක් මෙම දිසාවේ පිහිටා තිබූ අතර පෘතුගීසීන් සමඟ සටන් වැදී සිරිලක බේරා ගැනීමට ක්‍රියා කල පළමු රාජසිංහ රජතුමා අවසන් හුස්ම හෙලුවේ ද කෑගලු දිසාවට අයත් කරවනැල්ල ප්‍රදේශයේ බව ඉතිහාසයේ සඳහන් කරයි. පළමු විමලධර්මසූරිය රජතුමා විසින් සෙංකඩගල කන්ද උඩරට රාජධානියේ ඇරඹුමත් සමඟ අභාවයට ගිය සීතාවක රාජධානිය කන්ද උඩරට සිංහල රාජ්‍යයේ ප්‍රදේශයක් ලෙස තව දුරටත් පැවතුණි. උඩරට රාජධානිය ආක්‍රමණය සඳහා ගිය විදේශ සේනාවන්ගේ විනාශය බොහෝ විට බලන කඳු පාමුල මෙම දිසාවට අයත් පහල කඩුගන්නාව ප්‍රදේශයේ දී සිදුවිය. සෙංකඩගල රාජධානියේ ආරක්ෂක පවුරක් මෙන් ක්‍රියා කල මෙම ප්‍රදේශය වීර ජනයා වාසය කළ ප්‍රදේශයක් ලෙස ඉතිහාසයට එක් වී ඇත. මහනුවර රාජ්‍ය සමයේ සතර කෝරළයේ පුද්ගලයින් විසින් කරන ලද වීර ක්‍රියා ජන කථා ලෙස අදත් විද්‍යාමානවේ.

ඉංග්‍රීසි පාලන සමයේ දී සතර කෝරළය තුන් කෝරළය හා පාත බුලත්ගම යන කෝරළ කෑගල්ල නමින් පරිපාලන ඒකකයන් ලෙස උප දිසාපති වරයෙකු යටතේ පවත්වාගෙන යන ලදී. ශ්‍රී ලංකාවේ පළාත් බෙදීම් අතරින් අවසාන බෙදීම ලෙස වෙන් කළ සබරගමු පළාත පිහිටුවීමත් සමඟ 1889 වර්ෂයේ සිට වර්තමාන මායිම් සහිතව කෑගල්ල දිස්ත්‍රික්කය ස්ථාපිත විය.

## The historical background


Dedigama Eth Pahana

According to the archeological evidences found in this area, the history of Kegalle district dates back to the pre historic era of Sri Lanka. There are many caves in Kegalle where pre historic humans lived in the stone age, including Kithulgala Belilena in which fossils of pre historic humans lived as early as 28,000 years ago have been discovered.Dorawaka lena, Alu lena, Lenagala, Asmadala, Ambalankanda, Helamada endow with the evidence for that. It is considered that the dolmen in Padavigampola is a ruin of pre historic era. According to the archeology of Kegalle district; it has been a region in Maya Rata of the three divisions of Sri Lanka named as Ruhunu, Pihiti and Maya. Further, King Vijayabahu the 1st who was one of the greatest kings in Sri Lanka, lived in this area and led the fights to free the country from Chola Empire. Wakirigala Fort, one of his rock fortresses is situated in this area. Further, Dedigama Kotawehera is considered as the birthplace of King Parakramabahu, the Great and Kegalle district is also considered as an area which provided immense labor and economic contribution for the fights of many kings in the past in Sri Lanka.

The Sithawaka Kingdom which was founded by King Mayadunne during the period in which Sri Lanka was invaded by Europeans is situated in this area and history reveals that King Rajasinghe I, who fought hard against Portuguese to free the country, eventually died in Karawanella area of Kegalle. However, Seethawaka area remained as a territory of the Kingdom of Kandy with the establishment of the Kandyan Kingdom by King Wimaladharmasooriya I. And, the foreign troops who passed on to invade the Kingdom of Kandy were almost destroyed at Pahala Kadugannawa area which is situated beneath the Balana mountain fort. This area which was used as a fortress of Kingdom of Senkadagala homed for many heroes in the past and there are many folk stories on heroics done by the people lived in the Sathara Koralaya during the reign of Kandy.

During the period of the British rule, the entire area of Sathara Koralaya, Thun Koralaya and Patha Bulathgama was administered under an Assistant Government Agent as a Kegalle Administrative Division. With the establishment of the Sabaragamuwa Province as the very last delimitation of provinces in Sri Lanka, Kegalle district was established in 1889 with the present boundaries.